# නැගෙනහිර නවෝදයට අත්වැලක් වූ රබර් වගාව

වී. එච්. එල්. රොද්‍රිගෝ සහ එස්. එම්. එම්. ඉක්බාල්

රබර් වගාවේ ආරම්භයේ සිටම ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි එහි තිබූ බලපෑම අතිවිශාලය. බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල රබර් වගා කිරීමට උත්සහ කළ නමුත් අවසානයේදී රබර් වගා කිරීම ශ්‍රී ලංකාවේ තෙත් කලාපයට පමණක් සීමා කරන්නට ඔවුන්ට සිදු විය. රාජ්‍ය පාලනය ශ්‍රී ලාංකිකයන් අතට පත්වීම, ජීවන ක්‍රම වෙනස් වීම, ලෝක ආර්ථිකයෙහි ඇති වූ වෙනස් කම් ඇතුළු සමාජ ආර්ථික බලපෑම්, රබර් වගාව ශ්‍රී ලංකාව තුළ අද පවතින තත්ත්වය තිරණය කර ඇත. දැනට ස්වභාවික රබර් නිෂ්පාදනය අතින් නව වන ස්ථානයේ පසුවන ශ්‍රී ලංකාව පසුගිය වසරෙහි අමු රබර් අපනයනයෙන් රුපියල් මිලියන 4,724ක් උපයා ඇති අතර රබර් භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම රුපියල් මිලියන 39,000 ඉක්මවා තිබේ. වර්තමාන ජීවන රටාව පවත්වා ගැනීමට අවශ්‍ය බොහෝ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ස්වභාවික රබර් අත්‍යාවශ්‍ය වේ. එබැවින් ජීවන තත්ත්වයේ වැඩිදියුණුව රබර් වෙළඳපොළ තව දුරටත් ශක්තිමත් කිරීමට ඉවහල් වී ඇත. එලෙසම කෘතිම රබර් සඳහා ඇති අධික මිලත්, පරිසර හිතකාමී ද්‍රව්‍ය පිළිබඳ ඇති නැඹුරුවත් තුළින් ස්වභාවික රබර් වෙළඳපොළ ශක්තිමත් වීමට බලපා ඇත. ශ්‍රී ලංකාව තුළ රබර් හා සම්බන්ධ කර්මාන්ත වැඩිවෙමින් පවතින අතර එමගින් ප්‍රාථමික තත්ත්වයෙන් නිර්යාත කරනු ලබන අමු රබර් වෙනුවට විශේෂිත මිලක් සහිත රබර් භාණ්ඩ නිර්යාතය තුළින් විශාල විදේශ විනිමයක් උපයා ගත හැක. එලෙසම මෙම කර්තව්‍ය නව රැකී රක්ෂා ජනනය කිරීමටත් මූලික වී තිබේ. මෙම ක්ෂේත්‍රයේ ශ්‍රී ලාංකික හැකියාවන් සහතික කිරීමට හොඳම නිදසුනක් වන්නේ දැනට ලෝකයේ ගල් ටයර් නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානය ගන්නා ලෝඩ්ස්ටා සමාගමයි.

රබර් පර්යේෂණායතනයත් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවත් ඉඩම් හිමියන් හා එකතුව රබර් වගාවේ ඵලදායිතාවය ඉහළ දැමීම සඳහා කටයුතු කළ ද, මේ තුළින් පමණක් අනාගත රබර් අවශ්‍යතාවය සඳහා වූ ඉලක්කය කරා ළඟා විය නොහැක. එසේ නම් ඊළඟ ප්‍රයත්නය විය යුත්තේ රබර් වගාව කරනු ලබන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමයි. නාගරීකරණය හා කාර්මිකකරණය අපගේ තෙත් කලාපය තුළ ඉතා දැඩිව සිදු වන බැවින් නව රබර් වගාවන් සඳහා ඉඩම් සොයා ගැනීම ඉතාමත් අපහසුය. එබැවින්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අරමුණ වී ඇත්තේ දකුණු හා නැගෙනහිර වර්ෂාපතනය අනුව අතරමැදි කලාපයන්ට අයත් ප්‍රදේශ තුළ රබර් වගාව ප්‍රචලිත කිරීමයි. මෙ මගින් ත්‍රිවිධාකාර ප්‍රතිලාභ අපහට උරුම වනු ඇත. මූලිකව රබර් නිෂ්පාදනය හා රබර් භාණ්ඩ නිෂ්පාදනය තුළින් ජාතික ආදායම වැඩි වනු ඇත. දෙවනුව මෙවැනි වැඩ සටහනක් තුළින් වැඩිපුරම ප්‍රතිලාභ ලබනුයේ කෘෂි කර්මාන්තය තම ජීවනෝපාය කරගත් දැනට දරිද්‍රතාවය තුළ සිර වී සිටින අහස් දියෙන් වගා කටයුතුවල නියැලෙන සහෝදර ගොවි ජනතාවයි. මෙවැන්නක් තුළින් ගැමි ආර්ථිකය ශක්තිමත් වන අතර සමෘධි වැනි සහනාධාර ක්‍රම සඳහා වැය වන මුදල් සම්භාරය ඉතිරිකරගත හැක. තෙවැනි වාසිය වන්නේ ස්වභාවික වනයකට පමණක් දෙවැනි වන රබර් වගාව තුළින් විනාශ වූ පරිසරය නැවත ගොඩ ගැනීමයි. විශේෂයෙන්ම දැනට දිගුකාලීන හේන් ගොවිතැන් තුළින් නිසරු වූ ගොවි බිම්වල රබර් වගාව

ඈලින් එම ඉඩම් ප්‍රතිස්ථාපනයටත් වායු ගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් ($CO_2$) තිර කර මිනිසාට අහිතකර වූ හරිතාගාර බලපෑම අවම කිරීමටත් ඉඩ ප්‍රස්ථා ඇත.

දැනට අතර මැදි කලාපයේ ඇති රබර් වගාව මොණරාගල හා හම්බන්තොට දිස්ත්‍රික්කවල හෙක්ටයාර් 4,000 කට අඩු ඉඩම් ප්‍රමාණයකට සීමා වී තිබේ. යුද්ධයේ බලපෑමට ලක් වූ නැගෙනහිර පළාත, වර්තමානයේ "නැගෙනහිර නවෝදය" වැඩ සටහන තුළින් දියුණු තත්ත්වයකට පරිවර්තනය කිරීම රජයේ අරමුණ වී තිබේ. මෙම ප්‍රදේශයේ ජනගහනය විසිරී ඇති අතර රබර් වැනි වැවිලි බෝග සඳහා අවශ්‍ය ඉඩම් සපයා ගැනීම අපහසු නොවේ. රබර් පර්යේෂණායතනය හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ කරනු ලැබූ මූලික සමීක්ෂණයකින් මෙම නැගෙනහිර පළාත රබර් වගාවට සුදුසු යැයි හැඟී ගිය බැවින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස නැගෙනහිර පළාත තුළ රබර් වගාව ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කරන ලදි. මෙම ලිපිය තුළින් එම වැඩ සටහනේ වර්තමාන තත්ත්වය විදහා දැක්වෙන අතර විශේෂයෙන්ම වගා කළ හැකි ප්‍රදේශ, දැනට ඇති රබර් වගාවන් හි තත්ත්වය හා ගොවීන් මේ තුළින් ප්‍රතිලාභ ලබන ආකාරය විස්තර කෙරේ.

නැගෙනහිර පළාත ප්‍රධාන වශයෙන් කෘෂි දේශගුණික කලාප 2 කට වෙන් කර දැක්විය හැක. එනම් අංක 1 රූපයේ දැක්වෙන ආකාරයට IL 2 ලෙස නම් කර ඇති අතරමැදි කලාපයත් DL 2 ලෙස නම් කර ඇති වියළි කලාපයත් ය. වියළි කලාපයට සාපේක්ෂව වැඩි පුර වර්ෂාපතනයක් ඇති අතරමැදි කලාපය, රබර් වගාව සඳහා මූලිකව තෝරා ගන්නා ලදි (රූපය 1). මෙම කලාපය අම්පාර දිස්ත්‍රික්කයට අයත් වන අතර පදියතලාව හා මහඔය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පවතී. පදියතලාව ප්‍රදේශයේ ගම් 75ක් පමණ අඩංගු වන ග්‍රාමසේවා වසම් 20ක 16,970ක ජනගහණයක් පවුල් 3,970ක් තුළ පවතී. එලෙසම 30,000ක් පමණ ජනගහනයක් මහඔය ප්‍රදේශයේ ග්‍රාමසේවා වසම් 17ක ජීවත් වේ. ප්‍රදේශයේ සිටින ජනගහණයෙන් 95% පමණ පූර්ණකාලීන ගොවීන් වන අතර මොවුන් අහස් දියෙන් වගා කරන කවුපි, බඩඉරිඟු, වට්ටක්කා, මිරිස්, වී, කුරක්කන් සහ කෙසෙල් යන වගාවන්හි නිරත වේ. ප්‍රධාන බහු වාර්ෂික බෝග වන්නේ දෙහි, දොඩම්, අඹ, කජු තේක්ක සහ පොල් ය. සාමාන්‍යයෙන් එක් පවුලක් සතුව ඉඩම් අක්කර 5ක් පමණ ඇති අතර මෙම ඉඩම් දිගුකාලීන හේන් ගොවිතැනෙන් උරුම වූ බව පෙනී යයි. ගොවීන් රජයෙන් නිකුත් කරනු ලබන බලපත්‍ර සහිතව හෝ රහිතව මෙම ඉඩම්වල වගා කටයුතු කරනු ලැබේ. කෙසේ නමුදු ගොවීන් හට කැලෑ සහිත බිම් එළිපෙහෙළි කිරීමට අවකාශ නොමැත. දිගුකාලීනව කරන ලද වාර්ෂික බෝග වගාව එම බෝගවල ඵලදායිතාවය සීමා කර ඇති අතර හදිසියේ සිදු වන කාලගුණික විපර්යාසයන් ද මෙම බෝග කෙරෙහි දැඩිව බලපා තිබේ. එම නිසා ස්ථිර ආදායම් මාර්ගයක අවශ්‍යතාවය ගොවීන් හට දැඩි ලෙස උවමනා වී තිබේ. මෙම තත්ත්වයන් යටතේ රබර් වගාව මෙම ප්‍රදේශයන්ට උචිත බව පෙනියන බැවින් ඒ සඳහා අවශ්‍ය ඉඩම් බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කැමැත්ත පළ වී තිබේ.

දැනට රබර් වගාව පිළිබඳ හොඳින් සැකසුනු ව්‍යාප්ති සේවයක් මේ ප්‍රදේශය තුළ නොමැති බැවින් වගා කටයුතු පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමත්, වගාවන් හි තත්ත්වය නිරීක්ෂණය කිරීමත් එතරම් පහසු නොවේ. රබර් වගාව සඳහා මූලිකව අවශ්‍යවන තාක්ෂණ ක්‍රම පිළිබඳ වැඩමුළු ව්‍යාපෘතිය ආරම්භයේ දී සිදු කරන ලදි. මෙය ප්‍රමාණවත් නොවන බැවින් ග්‍රාමීයව, ස්වභාවිකව පවතින සංනිවේදන ක්‍රම වන කටින් කට, දැකීම තුළින් විශ්වාසය ඇති කිරීම සහ ගැමියන් විසින් විශ්වාසය තබා ඇති

පුද්ගලයන්ගේ මැදිහත් වීම දැනුම සම්ප්‍රේෂණය කිරීම සඳහා යොදාගන්නා ලදි. මෙහිදි කෝමාන ග්‍රාමය කේන්ද්‍ර කොට පදියතලාව ප්‍රාදේශිය සභාව තුළ රබර් වගාව ප්‍රචලිත කිරීමේ ක්‍රම වේදය සකසන ලදි. ආරම්භයේදී එනම්, 2003 වසරේදි ගොවින් තුන් දෙනෙකු සමඟ අක්කර තුනක රබර් පැළ සිටවන ලදි. පාරම්පරිකව පවතින කෘෂි කාර්මික ක්‍රම වලට හා ග්‍රාමිය ජිවන රටාවට හානි නොවන ලෙස රබර් වගාව පවත්වා ගෙන යාම සඳහා ගොවින් හට ප්‍රදේශයට උරුම වූ බෝග වන බඩඉරිගු සහ කවුපි වැනි බෝග රබර් සමඟ වගා කිරීමට ඉඩ හරින ලදි (රූපය 2). පළමු උත්සහයේදි ගොවින් දෙදෙනෙකු පමණක් සාර්ථක වුවද ඊළඟ වර්ෂය සඳහා මෙම දෙදෙනා සමඟ ගොවින් 18ක් රබර් වගාවට අවතිර්ණ විය. මෙහිදි අක්කර 18ක භූමි ප්‍රදේශයක රබර් වගා කිරීමට හැකි විය. තුන්වන වසරේදි රබර් වගාව කෝමාන ග්‍රාමය හා බැඳි තිබෙන හෙළකෝමාන ග්‍රාමයටද ප්‍රචලිත කිරීමට හැකි විය. 2007 වසර අවසාන වන විට ගොවින් 140 ක් සමගින් අක්කර 150 කට වැඩි ප්‍රදේශයක් තුළ රබර් වගා කර තිබිණ.




**රූපය 1.** නැගෙනහිර පළාතේ රබර් වගා කිරීමට යෝජිත කෘෂි දේශගුණික කලාප

වර්තමානයේ රබර් වගාව සඳහා දැඩි ඉල්ලුමක් කෝමාන අවට ඇති කෙහෙල්උල්ල, මිරිස්වත්ත සහ හතුකුඹුර යන ප්‍රදේශවල ද පවති. තත්ත්වය මෙසේ වුව ද ප්‍රදේශයේ යටිතල පහසුකම් අවම වීම රබර් වගාව ව්‍යාප්ත වීම සිමා වනු ඇත. වගාවට සුදුසු රබර් පැළ සකසා ගැනිම, ක්‍රමානුකූලව හා ඉතා සුපරික්ෂාවෙන් කළ යුතුව ඇති අතර ප්‍රදේශයට ඇති ළඟම රබර් තවාන පිහිටා ඇත්තේ කි.මි. 150 ට වඩා වැඩි දුරකින් පිහිටි මොණරාගල ප්‍රදේශයේය. එම නිසා 2007 වසරේ දි කෝමාන හා හෙළකෝමාන ග්‍රාමයන්හි කුඩා බෑග් පැළ තවාන් කිහිපයක් ඇති කිරීමට ගොවින් යොමු කරන ලද අතර බෑග්වල සිටු වීම සඳහා අවශ්‍ය බද්ධ කළ රබර් පැළ අංකුර වර්ධනයට පෙර පස් රහිතව ලබා දෙන ලදි. ක්ෂේත්‍රයේ

වගාකළ යුතු කාලයට මාස 7කට පමණ පෙර මෙම තවාන ඇති කළ බැවින් අවශ්‍ය මට්ටමට පැළවල වර්ධනය පවත්නා ගැනිම එතරම් අපහසු නොවීය. ගොවීන්, විශේෂයෙන් කණ්ඩායම් නායකයින් තවාන් නඩත්තුව පිළිබඳ දැනුවත් කරන ලද අතර 2007 වසරේදී රබර් වගාවට යොමු වූ සියලුම ගොවීන් මෙම තවාන් රැක බලා ගැනිම සඳහා ඉදිරිපත් විය. කෝමාන හා හෙළකෝමාන ගම්වල තිබූ පෞද්ගලිකව පාවිච්චි කල දුරකථන දෙක ගොවීන් හා අප අතර දැනුම සංනිවේදනය කිරීමට දායකත්වයක් සැපයිය. අපහට නිරතුරුවම ගොවි කණ්ඩායම් නායකයන්ගෙන් දුරකථන ඇමතුම් ලැබිණ. අවම වශයෙන් මෙම ඇමතුම් සතියකට එකක් පමණවත් වූ අතර විශේෂිත අවස්ථාවන්හිදී වැඩි ඇමතුම් ප්‍රමාණයක් ලැබිණ. දෙපාර්ශයටම පහසු වන පරිදි හා වෙනත් රාජකාරී කටයුතුවලට බාධා නොවන ලෙස මෙම දුරකථන සාකච්ඡා කාර්යයාල වේලාවෙන් පරිබාහිරව උදයේම හෝ සවස පවත්වන ලදි. මෙම පහසු කම තුළින් මාස 2කට පමණක් වන පරිදි ක්ෂේත්‍ර චාරිකාවන්හි නිරත වී වගාවන්හි ප්‍රගතිය පවත්වා ගැනිමට හැකි විය.




**රූපය 2.** පදියතලාව ප්‍රදේශයේ රබර් සමඟ කවුපි සහ බඩ ඉරිඟු වගා කරන ලද ඉඩම්

**වගාවන්හි වර්ධනය**

2003 සිට 2005 දක්වා වගාවන්හි සිටුවන ලද පැළවලින් දළ වශයෙන් 75% ක් පමණ ප්‍රමාණයක් හොඳින් ස්ථාපනය වී තිබීම මෙහි සාර්ථකත්වය මැනවින් කියා පාන්නකි. කෝමාන ගම්මානයට සාපේක්ෂව හෙළකෝමාන ගම්මානයේ සිටුවන ලද රබර් පැළ මඳක් පසු බෑමට ලක් වී තිබිණ. රබර් ප්‍රදේශයට අලුත් වගාවක් වූ බැවින් ගොවීන් සතු දැනුමේ දුර්වලතා මෙයට හේතු වන්ට ඇතැයි අපි විශ්වාස කරමු. වගාව පිළිබඳ වැඩමුළු පැවැත්වුවද ගොවීන් හට අවශ්‍ය ආකාරයෙන් දැනුම ලබා ගැනිමට ඒවා ප්‍රමාණවත් නොවීය. නිතර නිතර උපදෙස් ලැබීමට අවකාශ තිබීමත් වගාව පිළිබඳ ගැටළු සොයා බැලිම සඳහා දැනුම ඇති පුද්ගලයෙකු ප්‍රදේශයේ සිටීමත් මෙම ගොවීන්ගේ අවශ්‍යතාවයක් වී තිබිණ. කලට වේලාවට පැළ සිටුවීම අත්‍යවශ්‍ය කරුණක් වුවද පැළ සිටුවීමේදී යම් ප්‍රමාද දෝෂයන් ඇති විය. පොහොර දැමීමද, නිසිකලට සිදු නොවූ අතර යොදන ලද වාර ප්‍රමාණය වර්ෂයකට එක් වරකට සීමා විය. මෙම සීමාකාරී තත්ත්වයන් යටතේ වුවද රබර් වගාවේ දක්නට ලැබූ වර්ධනය සතුටුදායක මට්ටමක පැවතිණ. කෙසේ වුවද පොහොර යෙදිම පිළිබඳ නිර්දේශයන් තෙත් කලාපය තුළ

කරන ලද පර්යේෂණයන් හා බැඳී ඇති බැවින් මෙම ප්‍රදේශයේ පාංශු තත්ත්ව පරීක්ෂා කර මෙම නිර්දේශයන් ප්‍රතිසංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

සියලුම ඉඩම් සඳහා සහ මුළු කාලපරිච්ඡේදය සඳහා සාමාන්‍යයෙන් වසරකට සෙ.මී. 7.3ක කඳ මහත් වීමේ සීඝ්‍රතාවයක් දක්නට ලැබිණ. 2003 වසරේදී සිටුවන ලද රබර් ශාකයන් හි වර්ධන වේගය වර්ෂයකට 8.2 ක් වූ අතර මෙය 2004 වර්ෂයේ සිට වූ පැළ සඳහා 9.4 ක් විය. මෙම වර්ධන වේගය වැඩි වීම රබර් වගාව පිළිබඳ පළපුරුද්දෙන් ලැබුණ ප්‍රතිලාභයක් බව පෙනියයි. තෙත් කලාපය තුළ ඉතා හොඳ වර්ධක තත්ත්වයන් යටතේ වසරකට සෙ.මී. 10ක වර්ධන සීඝ්‍රතාවයක් බලාපොරොත්තු වන අතර මෙ මගින් අවු 5ක් අවසානයේ කිරි කැපීමට සුදුසු වගාවක් ලබා ගැනීම අපේක්ෂාවයි. එනමුදු ඉතාම ස්වල්පදෙනෙකු මෙම තත්ත්වයන් කරා ළඟා වන අතර රබර් හොඳින් වගා කරන බොහෝ අය වසරකට සෙ.මී. 8ක පමණ වර්ධක වේගයක් තබා ගනිමින් අවු 6කදී කිරි කැපීමට හැකි තත්ත්වයකට ළඟාවේ. තෙත් කලාපයේ ද බොහෝ කුඩා ඉඩම් හිමියන් රබර් වගාවන්හි වර්ධක වේගය ඉතා අඩු බැවින් කිරි කපා ගැනීම සඳහා අවුරුදු 7ක් හෝ ඊට වැඩි කාලයක් ගත කිරීමට සිදුවේ. දැනට පවතින තත්ත්වය යටතේ කෝමාන හා හෙළකෝමාන ගම්වල බොහෝ රබර් ඉඩම්වල අවුරුදු 7කට පෙරාතුව රබර් කිරි කැපීම සිදු කළ හැකි වනු ඇත. ඉදිරි වසර වලදී රබර් වගාව පිළිබඳ ගොවීන්ගේ හැකියාව තවදුරටත් වැඩිවන බැවින් අවශ්‍ය වර්ධන වේගයන් පවත්වා ගැනීම එතරම් අපහසු නොවනු ඇත.

**ශක්තීන්, දුර්වලතා, අවස්ථා, අවධානම් පිළිබඳ සමීක්ෂණ (SWOT)**

ප්‍රදේශයේ රබර් වගාව ව්‍යාප්ත කිරීමේ ක්‍රම වේදයන් සකස් කිරීම අරමුණු කොට SWOT විශ්ලේෂණයක් සිදු කරන ලද අතර මේ සඳහා කෝමාන හා හෙළකෝමාන ගම්වල රබර් වගාව පිළිබඳ උනන්දුවක් දක්වන ගොවීන් රැස් කරන ලදී. රබර් වගාව ප්‍රදේශයට හඳුන්වා දී වසරකට පසු මෙම විශ්ලේෂණය සිදු කළ බැවින් මෙම අවස්ථාව වන විට රබර් වගාව පිළිබඳ යම් ප්‍රායෝගික දැනුමක් ගොවීන් හට තිබිණ. රබර් වගාව සඳහා කැප කළ හැකි ඉඩම් තිබීම විශාලතම ශක්තිය වූ අතර 70% ක පමණ ගොවීන් හට අක්කර 03 සිට 04 දක්වා ප්‍රමාණයක් රබර් වගාව වෙනුවෙන් යෙදීමට හැකියාව තිබුණි. මෙම වැඩමුළුව සඳහා සහභාගි වූ සියලුම ගොවීන් රබර් වගා කිරීමට කැමැත්තෙන් සිටි අය බැවින් රබර් වගාව සඳහා ගොවීන් සතු කැමැත්ත ශක්තීන් අතරින් දෙවන ස්ථානය ගනී. ගොවීන්ගේ මතය අනුව පරිසර සාධකවල සුදුසු බව මධ්‍යස්ථ තත්ත්වයක පැවතිණ. ගොවිතැන් කර ලද පළපුරුද්ද ශක්තීන් අතර පස්වන ස්ථානය ගත් නමුත් සියලුම ගොවීන් ගොවිතැන පිළිබඳ දිගුකාලීන පළපුරුද්දක් ඇත්තෝ වූහ. විශේෂයෙන්ම ගොවීහු තමුන්ගේ පවුල තුළ ඇති ශ්‍රමය රබර් වගාව සඳහා යෙදවීමට කැමැත්ත පළකලහ. පාරම්පරික ගම්මාන වන බැවින් පවුල් අතර ඇති අන්තර් සම්බන්ධතා ද රබර් වගාව සඳහා ශක්තියක් විය. මෑතකදී පිහිටුවා ගන්නා ලද රබර් පිළිබඳ සමිතිය ද වැදගත් ස්ථානයක් ගනී.

ප්‍රධාන දුර්වලතා 6ක් වාර්තා වූ අතර රබර් පිළිබඳ ඇති දැනුම මඳ බව, රබර් සහනාධාර ලබා ගැනීම සඳහා ඉඩම්වල අයිතිය තහවුරු කිරීමේ ලිපි ලේඛනවල ඇති ගැටළුව; තමන් සතුව ඇති දුර්වල මූල්‍යමය තත්ත්වය, පහත් තත්ත්වයක ඇති යටිතල පහසුකම් (විශේෂයෙන් ම අබලන් වූ මාර්ග), වියළි කාල සහ කාලීනව ශ්‍රමය සඳහා ඇති අධික ඉල්ලුම මේවා වේ. 70% ක පමණ ගොවීන් හට රබර්

සහනාධාරය සඳහා අවශ්‍ය රජයෙන් නිකුත් කරන ඉඩම් බලපත්‍ර නොතිබිණි. පසුව මෙය ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ සාකච්ඡා කරන ලදුව ඔහු විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, සහය ඇතුව මෙම ප්‍රශ්න නිරාකරණය කිරීමට එකඟ විය. අනිත් දුර්වලතා යම් පමණකට තිබුණද ඉඩම් සඳහා අවශ්‍ය බලපත්‍ර නිකුත් කරන්නේ නම් රබර් වගාව සඳහා ඉතා කැමැත්තක් ගොවීන් විසින් දක්වන ලදි.

රබර් වගාව සඳහා ලැබෙන ව්‍යාප්ති සේවය ප්‍රධාන හා වැදගත්ම අවස්ථාව ලෙස ගොවීන් විසින් නම් කළ අතර දෙවන ස්ථානයේ පසු වූයේ රබර් සහනාධාරය තුළින් ලැබෙන මූලාධාරයි. ඉඩම් පිළිබඳ අයිතිය තහවුරු කිරීමේ හැකියාව සහ රබර් වගාව ආශ්‍රිතව ඇතිවන ආදායම් උපයා ගැනීමේ වෙනත් ක්‍රමවේදයන් පිළිවලින් අවස්ථා ලැයිස්තුවේ තුන්වන හා හතරවන ස්ථානය ගන්නා ලදි.

අනපේක්ෂිත නියඟයන් ප්‍රධානතම තර්ජනය වූ අතර 40% පමණ ගොවීන් වැඩි අවදානම් තත්ත්වයේ පසු වූහ. මෙයින් උපයෝගිතා පර්යේෂණවල අවශ්‍යතාවය පෙන්නුම් කරන අතර සාමාන්‍යයෙන් මෙම ප්‍රදේශය තුළ මාර්තු සිට සැප්තැම්බර් දක්වා දිගු වියළි කාලයක් පවතී. (අප්‍රේල්, මැයි මාසවල සුළු වැසි සහිත) වියළි කාලගුණයන්හි බලපෑම අවම කිරීම සඳහා මලුවල බහා ලූ හොඳින් වර්ධනය වූ මුල් සහිත පැළ භාවිතයත්, වෙනත් කෘෂි ක්‍රම උපායන් වන වැඩි ගැඹුරක සිටුවීමත්, වසුන් යෙදීමත් දැක්විය හැක. විශේෂයෙන්ම පිදුරු වසුනක් වශයෙන් සුදුසු වන අතර එයින් ලැබෙන පොටෑසියම් මූල ද්‍රව්‍ය රබර් ශාකය වියළි තත්ත්වයට ඔරොත්තු දීමට හැකියාව ලබා දෙයි. එලෙසම නිරිත දිග මෝසමේ ආරම්භයත් සමඟ පැළ සිටුවීම වියළි කාලගුණයට පෙරාතුව ඒ සඳහා හොඳින් ඔරොත්තු දිය හැකි වගාවක් ඇති කිරීමට අවකාශ ලබාදෙයි. ලෙඩ රෝග පිළිබඳ යම් බියක් පළකළද 47% ක් පමණ ගොවීන් හට මෙය ඉතා අඩු තත්ත්වයක් ලෙස සැලකිය. සුළි සුළං ද අවදානමක් සේ සැලකිණ. රබර් මිලෙහි හදිසි පහළ යෑම් සහ වල් සතුන්ගෙන් වගාවට පැමිණිය හැකි හානිද අවදානම් ලැයිස්තුවට එක් වූවද ඒවා ඉතා පහළ මට්ටමක පැවතුණි.

## ඉදිරි ගමන් මඟ

රබර්වල වර්ධනය හා සාමාජීය කරුණු පිළිබඳ මේ දක්වා ලබා ගන්නා ලද දත්තයන් ප්‍රදේශයේ රබර් වගාව ස්ථාපනය කිරීම පිළිබඳ ධන ආකල්ප ඇති කරයි. මූලිකව වර්ෂාව අනින් අතර මැදි කලාපය ඉලක්ක කොට රබර් වගාව ප්‍රචලිත කළ හැකි අතර පසු කාලීනව ගොවීන්ගේ දැනුවත් වීම හා ප්‍රදේශය සඳහා වඩාත් සුදුසු තාක්ෂණයක් සොයා ගැනීමත් සමඟ අනිත් ප්‍රදේශ කරා ද රබර් වගාව සඳහා ගොවීන්ගේ උනන්දුව හා කැපවීම තිබුණද රාජ්‍ය ව්‍යුහය තුළ ප්‍රධාන වගකීම් 4ක් පවතී. රබර් පර්යේෂණායතනය විසින් ප්‍රදේශය සඳහා උපයෝගිතා පර්යේෂණ තුළින් වඩාත් සුදුසු තාක්ෂණයක් සොයා ගත යුතුය. එලෙසම ඔවුන් විසින් එම දැනුම රබර් ව්‍යාප්ත සේවය සඳහා මූලික වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවටද ලබා දීමටද කටයුතු කළ යුතුව ඇත. විශේෂයෙන්ම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව අවශ්‍ය පැළ සහ පොහොර වැනි වෙනත් අවශ්‍ය දෑ කලට වේලාවට සැපයිය යුතු වේ. ප්‍රාදේශීය ලේකම්වරු විසින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය සහනාධාර නිකුත් කිරීමට හැකි වන අයුරින් අදාළ ඉඩම් සඳහා වගා කිරීමට අවශ්‍ය සහතික පත් සැපයිය යුතු වේ. රාජ්‍ය ව්‍යුහය තුළ ආයතන අතර මෙවැනි සහ සම්බන්ධිය වැඩ සටහනක සාර්ථකත්වය පිළිබඳ සැක පහළ වූවද මේ දක්වා සිදුකරන ලද වැඩ කොටස දෙස හැරී බැලීමේදී සහයෝගයෙන් එකට වැඩ කිරීමේ හැකියාව මැනවින් දිස් වේ. අපගේ මෙම වසරේ අරමුණ වන්නේ අලුතින් රබර් අක්කර 100 ක් වගා කිරීමටත් ඊළඟ වසර වන

විට ඊට වඩා වැඩි ප්‍රමාණයක රබර් වගා කිරීමට යොමු විමය. හෙළකෝමාන ග්‍රාමසේවා වසම තුළ රබර් වගාකිරීමට හැකියාව ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 400 ඉක්මවයි. මෙයින් 75% ප්‍රමාණයකවත් රබර් වගා කළහොත් හෙක්ටයාර 300 ක් පමණ භූමි භාගයක් හෙළකෝමාන තුළ රබර් වගා කිරීමට දායක වේ. මෙම තත්ත්වයන් අනෙකුත් ග්‍රාමසේවා වසම්වල පැවතිය හොත් පදියතලාව හා මහඔය බල ප්‍රදේශයේ පවතින අන්තර් කලාපයට අයත් ග්‍රාමසේවා වසම් 37 තුළ හෙක්ටයාර් 10,000 කට වැඩි භූමි භාගයක් තුළ රබර් වගා කිරීමට හැකිවනු ඇත. මෙම ප්‍රමාණය මුළු රටේ දැනට පවතින රබර් ඉඩම් ප්‍රමාණයෙන් 10% වනු ඇත. අපගේ අවසාන අරමුණ වන මෙය කරා ළඟා විය හැකි වුවහොත්, මෙම ප්‍රදේශයේ ඇති ආර්ථික තත්ත්වය තුළ විශාල පෙරලියක් ඇතිවන බව නොඅනුමානය. රබර් වගාව තුළින් ප්‍රදේශයේ වෙළඳපොළ තුළ ඇතිවන සංවර්ධනය නිසා රබර් වගාවේ නියැලෙන ගොවීන්ට අමතරව අනෙක් අය හටද ප්‍රතිලාභ ලැබෙනු ඇත. රබර් හා සම්බන්ධ කර්මාන්ත ද ප්‍රදේශය තුළට පැමිණීමට අවකාශ ඇති බැවින් විවිධ මට්ටම්වල රැකී රක්ෂා උත්පාදනයට මග පෑදේ. අවසානයේ නැගෙනහිර පළාතේ අතරමැදි කලාපය තුළ වාසය කරන 45,000 කට අධික ජනතාවත් මෙයින් ප්‍රතිලාභ ලබනු ඇතැයි අපගේ විශ්වාසයයි.